# හෙළ කෙතේ සුවඳ විඳි රන් පුතෙකුගේ ඉදිරි දැක්ම

**ජී**නනය වූ, හැදුණු රන් පොළොවෙ හි එක්සේසත් නංවා, ලෝකයේ ම බුහුමන් ලැබූ ඓතිහාසික නායකයකුගේ පදවි ප්‍රාප්තියේ දෙවැන්න එළැඹ තිබේ. ඔහු කවියක් නම්, විවරණය කිරීමට ටීකා අනවශ්‍ය ය.

පළමු රාජ්‍ය මන්ත්‍රණ සභාවට ගිරුවාපත්තුවෙන් පත්ව, එතුළ කෘෂිකාර්මික වැඩපිළිවෙළ අභිනවයෙන් ඇරඹුන්නට පිඹුරුපත් සැකසුවකු විය. හෙතෙම මන්ත්‍රණ සභාව තුළ හේනට, ගොයමට පෙම්බැඳි අභිජාත සිංහලයකු විය. ඔහුගේ කෘෂිකාර්මික සැලැසුම් මෙරට ඉදිරි දැක්ම සඳහා බෙහෙවින් දායක වූ බවට ඉතිහාසය මොනවට සාක්ෂ්‍යයෝ සපයති. හෙතෙම ඩී.ඒ. රාජපක්ෂ නම් විය. ඔහුගේ උත්තරීතර පුත්‍ර රත්නය මෙදින මෙරට කෘෂි නවෝදය උදෙසා මහත් වූ විප්ලවීය ක්‍රියාදාමයක නිරත අප ජනාධිපතිවරයා ම ය. පිය පරපුරෙන් ලද ආභාසය අනාගත පරපුර සඳහා දායාද කිරීමට ඔහු දරන තැන අභිමානනීය බව පැවසිය යුතු ම ය. ඒ ඔහුගේ වැඩපිළිවෙළ එතරම් ම විනිවිද පෙනෙන සුළු අර්ථාවබෝධයේ පහසුකාරී වී ඇති නිසා ය.

## කෙතට දියවර

"කෙතට දියවර" යන්න මහින්ද චින්තන කෘෂිකාර්මික සැලැස්මේ එන ප්‍රධාන සාකච්ඡාවකි. ඒ අනුව, හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය විසින් සිදු කෙරුණු පර්යේෂණ ඔස්සේ, ගොවි ප්‍රජාව අතර ජලය බෙදීයාමේ සමානතාවය හඳුන්වා දුන් නව ජල කළමනාකරණ විධි මගින් වගා තීව්‍රතාවයට හා ජල ඵලදායීතාවයට සිදු වන්නා වූ බලපෑම් එවැනි ක්‍රම මගින් සිදු වන්නා වූ ජල ඉතුරුව, ගොවීන් ඒ කෙරෙහි දක්වන රැඳියාව එම ක්‍රමවල වාසි අවාසි විමසීම සිදු කෙරිණි. ඒ අනුව, "මහවැලි එච් කලාපයේ ජල පංගු ක්‍රමය පිළිබඳ තක්සේරු කිරීම", "ශ්‍රී ලංකාව තුළ විවිධ අංශ කෙරේ ජලය බෙදී යාම අධ්‍යයනය", "ආයතනික මට්ටමේ වැසි දිය එක්රැස් කිරීම පිළිබඳ ආර්ථික විමසුම", "වාරිමාර්ග කළමනාකරණය තුළ රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරීත්වය (රිදී බැඳි ඇළ ගොවි සමාගම් ආකෘතිය ආශ්‍රිත ඇගයීම්), "ශ්‍රී ලංකාවේ ග්‍රාමීය කුඩා වැව්වල විකාශනය, ස්ථානගත කිරීම, ව්‍යාප්තිය හා එවයින් ඉටු වන අත්‍යවශ්‍ය ම සේවා" යන පර්යේෂණ අධ්‍යයනයන් හි සොයා ගැනීම් හා අනාවරණයන් මෙරට වත්මන් නායකත්වයේ අවශ්‍යතාවය හා අප ආයතනයේ දායකත්වය එක්තැන් කළ අවස්ථාවන් කිහිපයක් පමණි. හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ දැක්ම ගොවිජන අංශය පමණක් ම නොව ග්‍රාමීය අංශයේ ද තිරසාර සංවර්ධනය උදෙසා නව දැනුම ජනනය කර බෙදා හැරීම යි. මෙම දිනවල ආසියා පැසිපික් කලාපය සඳහා වූ ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන මධ්‍යස්ථානය (CIRDAP) හා ඉන්දියානු ග්‍රාමීය සංවර්ධනය සඳහා වන ජාතික ආයතනය (NIRD) එක්ව සිදු කරන "ග්‍රාමීය පානීය ජලය සහ සනීපාරක්ෂක ව්‍යාපෘති කළමනාකරණය" පිළිබඳ දස දින ජාත්‍යන්තර පුහුණු වැඩසටහන ඒ සඳහා එක් අවස්ථාවක් පමණි. ග්‍රාමීය ව හැදී වැඩී පණ නළ ගැසූ අව්‍යාජ නායකයකුගේ අදිටන ග්‍රාමීය සංවර්ධනය නම්, එතැන ද අපි සිටින්නෙමු"යි නිරහංකාරව පවසන්නෙමු.

## වගාවට ඉඩම්

ජාතික ඉඩම් ප්‍රතිපත්තියක් සකසන මහින්ද චින්තනය මහවැලි යෝජනා ක්‍රමවල ගොවි ජනපද ගොවීන්ට ඉඩම් ලබාදීමත්, ගොවි බිම්වල සින්නක්කර අයිතිය තහවුරු කිරීමත් අරමුණු කොට ඇත. ඉඩම්, ගොවියා සතු ප්‍රධාන ම කෘෂි යෙදවුම යි. ඒ අනුව, ගොවි පවුල් 100,000 කට ඉඩම් ලබා දී එම ක්‍රමය තවදුරටත් ශක්තිමත් කොට සෑම ගොවියෙකුට ම ඉඩම් කැබැල්ලක් ලබාදීම හෝ භුක්ති විඳින ඉඩමේ අයිතිය තහවුරු කිරීම, මොරගහකන්ද කළු ගඟ සංවර්ධන ව්‍යාපෘතීන් යටතේ අලුතින් ඉඩම් හෙක්ටයාර 5,000ක් ලබාදීම, උතුරු-නැගෙනහිර පළාතේ ඉඩම් අහිමි ගොවි පවුල් 10,000කට නොමිලේ ඉඩම් ලබාදීම "මහින්ද චින්තන ඉදිරි දැක්මෙන්" අවධාරණය කොට ඇත. ජනාධිපතිවරයාගේ නිවේදනයන් පරිදි ක්‍රියාත්මක මෙම බොහෝ වැඩපිළිවෙළ සඳහා මෙම ආයතනයෙන් සිදු කරන පර්යේෂණ ඔස්සේ ලබා ගන්නා යෝජනා නිගමන දායක කර ගනු ලබයි. උදාහරණයක් ලෙස දක්වන්නේ නම් මෙම දිනවල අප ක්‍රියාත්මක කරන "ජනාවාස ඉඩම් තුළ අවිධිමත් ලෙස ඉඩම් කැබලි වී යාම පිළිබඳ අධ්‍යයනයේ දී නීත්‍යානුකූල භාවයෙන් තොර ව, එනම් අවිධිමත් ව පාරම්පරික ඉඩම් කට්ටිවලට බෙදී යාම නිසා කෘෂිකර්මාන්තයේ උද්ගත වී ඇති ගැටළු, වගා ඉඩම්වල ඵලදායීතාවයට සිදුව ඇති බලපෑම යනාදිය විශ්ලේෂණය කෙරේ. එය ඉදිරි ප්‍රතිපත්ති සම්පාදනය සඳහා ලබාදෙන පූර්වකථනයක් හා සමාන ය.

## අද ගොවි අයිතිය

"ශ්‍රී ලංකාවේ අද ගොවීන්ගේ ඉදිරි පරම්පරාවන් මුහුණ දී සිටින අවිනිශ්චිතතාවයන් සඳහා තිරසාර විසඳුමක් සැපයිය යුතු බවත්, ඒ සඳහා නො පමාව අවශ්‍ය නීතිරීති සකස් කරන බවත්" මහින්ද චින්තන ඉදිරි දැක්මෙන් කියැවේ. ඒ අනුව, 2010 යෝජිත අද ගොවි පනත් කෙටුම්පතෙ හි සංශෝධනය විය යුතු වගන්ති පිළිබඳ ඉඩම් හිමියන් හා නිලධාරීන්ගේ අදහස් හා යෝජනා විමසමින් අප විසින් මෑතක

දී සිදු කරන ලද "අද ගොවීන්ගේ වර්තමාන තත්ත්වය පිළිබඳ අධ්‍යයනය" මහින්ද රාජපක්ෂ නම් වූ දිගු කල්පනා ඇති නායකයාගේ අවශ්‍යතාවය ද අප විසින් හඳුනා ගනු ලැබූ බවට විද්‍යමානිත තවත් සාක්ෂියකි. විශේෂයෙන් ම, අද ගොවීන් සුරක්ෂිත කරන්නට යැ"යි හඬගාන පරිසරයක දී සිදු කෙරෙන විමර්ශනාත්මක යෝජනා ඉතා වැදගත් වුත්, සුවිශේෂී වුත් කර්තව්‍යයක් ඉටු කරනු ඇත යන්න අප හැඟීම යි.

## කෘෂි ව්‍යාප්ති සේවාව ගමට

ජනාධිපතිවරයාගේ ප්‍රමුඛ අරමුණක් වන කෘෂි ව්‍යාප්ති සේවාව ගමට ගෙන යාම අප ආයතනයේ ලැයිස්තු ගත අරමුණු අතර ද ප්‍රමුඛත්වය ගනී. විශේෂයෙන් ම, අප සතු භෞතික හා මානව සම්පත් පෙරටු කරගෙන ව්‍යාප්ති සේවාවේ නිරත වුවන් පුහුණු කිරීම කලෙක පටන් ම සිදු වේ. මෙම ආයතනයේ මානව සම්පත් හා ආයතනික සංවර්ධන අංශය නිරන්තරයෙන් ම ගමින් ගමට, යායෙන් යායට යමින් සිදු කෙරෙන පුහුණු කිරීම් හි ප්‍රගතිය ඇදෙන්නේ ද ජාතික නායකත්වයේ සැලසුම් කෙරෙහි ය. ඒ අනුව, "කෘ.ප.නි.ස. වරුන් පුහුණු කිරීමේ වැඩසටහන්", "ගැමි පිවිසුම් ක්‍රමවේදය භාවිතා කිරීම පිළිබඳ පුහුණු වැඩසටහන", "වාරි පුහුණුව ව්‍යාපෘතියේ සමාජ සජීවීකරුවන් පුහුණු කිරීමේ ව්‍යාපාරය", "කෘෂිකර්ම අලෙවිකරණ ව්‍යාපාර සේවය පිළිබඳ ජාතික පුහුණු වැඩසටහන", "කෘෂි තාක්ෂණය, තොරතුරු තාක්ෂණ සන්නිවේදනය හරහා ගොවීන්ට දැනුම සන්නිවේදනය කිරීම පිළිබඳ ඇගයීම" වැනි පුහුණු, මෑතකාලීන ව සිදු කෙරිණි. එසේ ම, "වස විසෙන් තොර ආහාර බෝග" "දේශීය බීජ දිරිගැන්වීම" "කාබනික ·පොහොර භාවිතයේ විභවතාවයන්" යන්න පිළිබඳ නිරන්තරව මෙම ආයතනයේ අවධානය යොමු වන බව කිව යුතු ය. දේශීයත්වයට නැඹුරු වූ ජාතික නායකත්වයේ මෙවැනි සංකල්පනා ද නිරතුරු ආයතනයේ අවධානයට ලක් වන බව ද කිව යුතු ය.

පලතුරු හා එළවළුවල පසු අස්වනු හානිය අවම කිරීම සඳහා කටයුතු කරන බව මහින්ද චින්තන ප්‍රතිපත්ති ප්‍රකාශනයේ පැහැදිළිව ම දක්වා තිබේ. පසු අස්වනු හානිය නිසා අහිමි වන 10%-35% අතර වූ අස්වැන්නක ප්‍රමාණය දේශීය ගොවි ආර්ථිකයට සිදු කරන්නේ බරපතල පාඩුවකි. එය අවධානයට ගනිමින් පසු අස්වනු තාක්ෂණ ආයතනය මඟින් පලතුරු හා එළවළු ඇසුරුම්කරණය හා ප්‍රවාහනය සඳහා ප්ලාස්ටික් ඇසුරුම් හඳුන්වා දෙන ලදී. සැපයුම් චක්‍රයේ විවිධ පාර්ශ්ව අතර මෙම ඇසුරුම් බෙදා හැරීම මෙහි දී අරමුණු කෙරිණි. ඒ අනුව, බෙදා හරින ලද ප්ලාස්ටික් ඇසුරුම් හේතුවෙන් ඇති වූ බලපෑම යහපත් නම් අඛණ්ඩ භාවිතය සඳහා නිර්දේශ ඉදිරිපත් කිරීම මෙම ආයතනයට පැවරී ඇති කාර්යභාරය අතර වේ. ඒ අනුව, ආයතනය විසින් අවසන් කොට ඇති අධ්‍යයනයෙ හි ප්‍රතිඵල හෙට දින තොරතුරු ප්‍රවාහයට එක් කිරීමට සූදානමින් පවතී.

## කෘෂි වෙළෙඳපොළ

ගොවීන්ගේ ප්‍රධාන ගැටළුවක් වන්නේ වෙළෙඳ පොළ අලෙවිකරණය යි. එය අවධානයට ගනිමින් යැපුම් මට්ටමේ කෘෂිකර්මාන්තය ලාභදායී වාණිජ මට්ටමට ගෙන ඒම මහින්ද චින්තනය අරමුණු කොටගෙන තිබේ. මෙම ආයතනයේ මුඛ්‍ය අරමුණක් වන්නේ ද ගොවි ජනතාවගේ සමාජ-ආර්ථික අභිවෘද්ධිය යි. එය සැලකිල්ලට ගනිමින් සුපිරි වෙළෙඳසැල් හරහා එළවළු අලෙවිකරණය පිළිබඳ ආයතනය මඟින් අධ්‍යයනය කොට තිබේ. සුපිරි වෙළෙඳසැල තුළ දී නිෂ්පාදක ගොවියන් හා පාරිභෝගිකයන් එකිනෙකා පෙර ගිවිසුම් ක්‍රමයක් යටතේ මුණගැස්වීම මෙහි දී අධ්‍යයනය කෙරිණි. සාම්ප්‍රදායික සැපයුම් චක්‍රය තුළ සිටින අතරමැදියන්ගේ අවාසි සහගත බලපෑම් අවම කිරීම මෙම ක්‍රමවේදයෙන් අපේක්ෂා කොට තිබිණි. එසේ ම ගොවීන්ගේ සුබසෙත අරබයා මහින්ද චින්තනය යෝජනා කළ කෘෂිකාර්මික රක්ෂණ යෝජනා ක්‍රම යනාදිය නිරතුරු මෙම අධ්‍යයනයන්ට බඳුන් වූ බව කිව යුතු ය.

හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ අලෙවිකරණ ව්‍යාප්ති සේවයේ අඛණ්ඩව ම නිරත වන්නේ ජනාධිපතිවරයාගේ ප්‍රතිපත්ති ද මනාව පිළිඹිබු කරමිනි. දෛනික ව ආහාර වෙළෙඳපොළ තොග, සිල්ලර හා ගොවිපොළ මිල ගණන් පිළිබඳ ගොවීන්, පාරිභෝගිකයන්, වෙළෙඳුන් හා අනෙකුත් පාර්ශ්වකරුවන් මෙන් ම මුද්‍රිත, විද්‍යුත් මාධ්‍ය ආයතන හා රාජ්‍ය, පෞද්ගලික ආයතන වෙත සපයන තොරතුරු වපසරිය ඉමහත් ය. සතිපතා හා මාස්පතා ඉංග්‍රීසියෙන් හා සිංහලෙන් පළ කෙරෙන "ආහාර ද්‍රව්‍ය විවරණිකාව", "ගොවි ජනතා" හා "ගොවිකටයුතු අධ්‍යයන (ඉංග්‍රීසි/සිංහල)" යන වාර ප්‍රකාශන එම කාර්යයේ දී ප්‍රමුඛස්ථානයක් ගනී. ආයතන වෙබ් අඩවිය ද ආහාර වෙළෙඳපොළ තොරතුරු සඳහා වන කදිම මූලාශ්‍රයකි. ජංගම දුරකතන සමාගමක් හා එක් ව ජංගම දුරකතන හරහා ක්ෂණික වෙළෙඳපොළ තොරතුරු සැපයුම් සේවාවක් ක්‍රියාත්මක කිරීමට මේ වන විට සියළු කටයුතු සූදානම් ය. එය ආහාර වෙළෙඳපොළ තොරතුරු පිපාසාවෙන් ඉල්ලුම් සැපයුම් ප්‍රවාහයේ සිටින සියළු පාර්ශ්වකරුවන්ට සුබදායක ආරංචියක් වනු නො අනුමාන ය.

**ලලිත් කාන්ත ජයසේකර**

*අධ්‍යක්ෂ*

**හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය**